00056

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙරපාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන
අවසාන පරීක්ෂණය - 2013

**ESC 2315 -** මුල් ළමාවියේ සංවර්ධනය

කාලය - පැය තුනයි.

---

දිනය - 2013.10.26 වේලාව - ප.ව. 01.30- ප.ව. 04.30 දක්වා

---

පළමු කොටසේ <u>සියළුම</u> ප්‍රශ්නවලටත් දෙවන කොටසේ ඕනෑම ප්‍රශ්න <u>තුනකට (03)</u> ත් පිළිතුරු සපයන්න.

<u>I - වන කොටස</u>

01. (i) දරුවන්ගේ 'සදාචාරාත්මක සංවර්ධනය' යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) දරුවන් සදාචාරාත්මක චර්යා සංවර්ධනය කර ගන්නා ආකාර තුනක් (03) ලියා දක්වන්න. (ලකුණු 03)

02. (i) පෙරපාසල් දරුවන්ගේ චිත්තවේගීය සංවර්ධනය දියුණු කිරීමෙහි ලා පෙරපාසල් ගුරුවරිය සතුවිය යුතු ගුණාංග තුනක් (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉහත සඳහන් කළ ගුණාංග වලින් එකක් තෝරාගෙන එය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

03. උදාහරණ එක (01) බැගින් දක්වමින් කුඩා දරුවන්ගේ "කායික සංවර්ධනය" සහ "මනෝ චාලක සංවර්ධනය" යන පද කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) පෙරපාසල් දරුවන්ගේ "සමාජීය සංවර්ධනය" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) පෙරපාසල් දරුවන්ගේ සාමාජිය සංවර්ධනය සඳහා පෙරපාසල් ගුරුවරියකට උදව් දිය හැකි ආකාර තුනක් (03) ලියා දක්වන්න. (ලකුණු 03)

05. ළදරුවන් සහ කුඩා දරුවන් සුහදශිලී සහ උත්තේජනාත්මක පරිසරයක ආරක්ෂාකාරීව සහ සුරක්ෂිතව හදාවඩා ගැනීම අත්‍යවශ්‍ය වේ.

කුඩා දරුවන්ගේ හිතකර සංවර්ධනය සුසධ්‍යකරණය සඳහා මවකට උත්තේජන ලබාදිය හැකි ආකාර තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

06. (i) දරුවන්ගේ භාෂා සංවර්ධනය සඳහා දෙමාපිය ආකල්ප බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) පෙර පාසල් දරුවන්ගේ කථනය සහ වාග්මාලාව සංවර්ධනය සඳහා අවස්ථාවන් ලබාදිය හැකි ආකාර දෙකක් (02) නම් කරන්න.

(ලකුණු 02)

07. ශ්‍රී ලංකාවේ දරුවන් විවිධ ආකාරයේ නිවෙස් පරිසරයන් අත් විඳියි.

(i) ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන විවිධ නිවෙස් පරිසර ආකාරයන් තුනක් (03) නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉහත සඳහන් කළ නිවෙස් පරිසර අතුරින් ඕනෑම එකක් (01) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

08. පෙරපාසල් දරුවන් තුළ බහුලව දන්නට ලැබෙන ඉගෙනුම් උපායමාර්ග තුනක් (03) කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ලකුණු 5 x8 = 40)

## II - වන කොටස

09. (i) කුඩා දරුවන්ගේ "පූර්ණ සංවර්ධනය" යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) පූර්ණ සංවර්ධනයේ විවිධ මූලාශ්‍ර සැලකිල්ලට ගනිමින්, පෙරපාසල් ගුරුවරුන්ට කුඩා දරුවන්ගේ පූර්ණ සංවර්ධනය සඳහා දායක වියහැකි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

10. (i) දෙමව්පියන් විසින්, පෙරපාසල්වියේ දරුවන්ගේ භාෂා සංවර්ධනය උදෙසා නිවෙස් පරිසරය තුළ උත්තේජන සැපයිය හැකි ආකාර තුනක් (03) සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ii) පෙරපාසල් පංති කාමරය තුළ පෙරපාසල් දරුවන්ගේ භාෂාව සංවර්ධනය කිරීම සඳහා ඔබ විසින් උපස්ථම්භන ලබාදෙන ආකාරය උදාහරණ දක්වමින් විග්‍රහ කරන්න.

(ලකුණු 10)

11. (i) දරුවකුගේ බුද්ධිමය සංවර්ධනය සඳහා ජීන් පියාජේ විසින් යෝජනා කළ අවධි හතර (04) නම් කරන්න.

(ලකුණු 04)

(ii) ජීන් පියාජේ ගේ න්‍යාය පාදක කොට ගනිමින් අවුරුදු 2-7 දක්වා දරුවන්ගේ සංවර්ධනාත්මක අවධියෙහි දක්නට ලැබෙන ප්‍රධාන ගුණාංග මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කල සංවර්ධනාත්මක අවධියෙහි දරුවන්ගේ ප්‍රධාන ගතිලක්ෂණ සැලකිල්ලට ගනිමින් පෙර පාසල් දරුවන්ගේ ගණිත කුසලතා සංවර්ධනය සඳහා ක්‍රියාකාරකමක් නිර්මාණය කරන්න. එම ක්‍රියාකාරකමෙහි පහත සඳහන් අංශ ඇතුළත් විය යුතුවේ.

- අ) ක්‍රියාකාරකමෙහි අරමුණු
- ආ) ඉගෙනුම් උපකරණ/ද්‍රව්‍ය
- ඇ) සංවර්ධනය කළයුතු නිපුණතා
- ඈ) ගුරුවරයාගේ සහභාගීත්වය
- ඉ) ශිෂ්‍ය සහභාගීත්වය

(ලකුණු 10)

12. (i) පෙරපාසල් දරුවන්ගේ දළ සහ සියුම් චාලක කුසලතා සංවර්ධනය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

(ii) පෙරපාසල් දරුවන්ගේ දළ සහ සියුම් චාලක හැකියා වර්ධනය සඳහා ඵලදායි අභ්‍යාසයක් සැලසුම් කරන්න. මෙම අභ්‍යාසය තුල අවම වශයෙන් විවිධ වූ ක්‍රියාකාරකම් තුනක් (03)වත් අඩංගු විය යුතුය.

(ලකුණු 08)

(iii) ඉහත සැලසුම් කළ අභ්‍යාසය ක්‍රියාත්මක කිරීමේදී පෙරපාසල් ගුරුවරියක ලෙස ඔබගේ භූමිකාව කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

13. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) මුල් ළමාවියේ ඉගෙනුම් උපායමාර්ග
(ii) පරිනතිය සහ ඉගෙනුම
(iii) ඉගෙනීමේ ක්‍රියාවලිය කෙරෙහි සූදානම වැදගත්වන අන්දම.

(ලකුණු 02 x10 = 20)

හිමිකම් ඇවිරිණි.

0005(

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2013**
**ADVANCED CERTIFICATE IN PRE-SCHOOL EDUCATION PROGRAMME**
**ESC2315– EARLY CHILDHOOD DEVELOPMENT**
**DURATION – THREE (03) HOURS.**

| Date: 26th October 2013 | Time: 1.30 p.m. – 4.30p.m. |
|---|---|

Answer all questions in **Part I** & three (03) questions from **Part II**.

## PART I

01. i. Explain in brief, what is meant by Moral Development in children.

(02 marks)

ii. State **three (03)** ways in which children develop moral behaviours.

(03 marks)

02. i. Name **three (03)** characteristics a pre-school teacher should possess in promoting emotional development of pre-school children.

(03 marks)

ii. Select any **one (01)** of the above characteristics and explain in brief.

(02 marks)

03. Citing examples **(one each)** briefly explain the terms "Physical development' and 'Psychomotor development' of young children.

(05 marks)

04. i. Briefly explain the 'Social development' in pre-school children.

(02 marks)

ii. State **three (03)** ways that a pre-school teacher can support the social development of pre-school children.

(03 marks)

05. Infants and young children need a safe and secure upbringing in friendly and stimulating environment. Briefly describe **three (03)** ways that a mother can provide stimulations that facilitate healthy development of young children.

(05 marks)

06. i. Explain in brief, the influence of adults attitudes on language development in children.

(03 marks)

ii. Name **two (02)** ways of providing opportunities for the development of speech and vocabulary in pre school children.

(02 marks)

07. In Sri Lanka children experience different types of home environments.

i. Name **three (03)** different types of home environment common in Sri Lanka.

(03 marks)

ii. Briefly describe **any one (01)** of the home environment described above.

(02 marks)

08. Briefly discuss **three (03)** learning strategies that are common in pre-school children.

(05 marks)
(8 x 5 = 40 marks)

## PART II

09. i. Explain the term 'Total development of young children'.

(06 marks)

ii. Considering different aspects of total development, discuss how the teachers can contribute to the total development of young children.

(14 marks)

10. i. Discuss **three (03)** ways on how parents can provide stimulations for the language development of their pre-school aged children at home environment.

(10 marks)

ii. Describe citing examples how you would use reinforcements in the pre-school classroom to promote language development in pre-school children

(10 marks)

11. i. Name the **four (04)** stages of cognitive development of a child suggested by Jean Piaget.

(04 marks)

ii. Based on Piaget's theory briefly describe the main characteristics of the developmental stages of the children passing the age 2 – 7 years.

(06 marks)

iii. Considering main characteristics of their developmental stage mentioned above, design an activity to develop mathematical skills in pre-school children.

Following aspects should be included in this activity.

a. Objectives of the activity.

b. Teaching Aids/materials.

c. Competencies to be developed.

d. Teacher participation.

d. Student participation.

(10 marks)

12. i. Briefly describe gross and fine motor skill development in pre-school children.

(04 marks)

ii. Plan an affective exercise to develop gross and fine motor skills of pre-school children. The exercise should include at least **three (03)** different activities.

13. Write short notes on any **two (02)** of the following.

i. Learning strategies in early childhood.

ii. Maturation and learning

iii. Importance of readiness in learning.

(2 x 10 = 20 marks)

*- Copyright reserved -*